770

# ශ්‍රී ලාංකේය ගෘහ සැලසුම්කරණය කෙරෙහි සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන්ගේ බලපෑම

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
02 OCT 2012
UNIVERSITY OF KELANIYA

දර්ශනපති උපාධි නිබන්ධය

නම -: උඩවෙල රේවත හිමි

අංකය -: FGS/04/02/07/2010/01

ප්‍රවේශ අංකය: 770
වර්ග අංකය:

සංස්කෘත අධ්‍යයනාංශය
මානවශාස්ත්‍ර පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය

2012 ජනවාරි

## ශ්‍රී ලාංකේය ගෘහ සැලසුම්කරණය කෙරෙහි සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන්හි බලපෑම

මිනිසා හා පරිසරය අතර ඇත්තේ අවියෝජනීය වූ අන්‍යෝන්‍යායත්ත සබඳතාවකි. සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන් නිර්මාණය කරන ලද ශ්‍රේෂ්ඨ වාස්තුවිද්‍යාඥයෝ මෙම කාරණය මනාව ප්‍රත්‍යක්ෂ කරගත් ඍෂිවරු වූහ. විශ්වයෙහි සමස්ත ක්‍රියාවලිය ම පෘථිවි, ආප්, තේජස්, වායු හා ආකාශ යන පඤ්චභූතයන්ගේ ක්‍රියාකාරිත්වය මත සිදු වේ. මනුෂ්‍ය ශරීරය පමණක් නොව සජීවී, අජීවී සමස්තයෙහි ම ආභ්‍යන්තරික වූ ද බාහ්‍ය වූ ද සංයුතිය මේ පඤ්චභූතයන් ය. සංස්කෘත වාස්තුවිද්‍යාඥයන් මේ පඤ්චභූතයන්ගේ ස්වභාවයන් භාවිත සිතින් ගවේෂණය කර වාස්තුසිද්ධාන්ත නිර්මාණය කර ඇත. පඤ්චභූතයන්ගේ විචල්‍යතාවන් ඍජු ව ම මිනිසාට බලපානු ලැබේ. පෘථිවි පෘෂ්ඨය මත අවකාශ සහිත ස්ථානයක ගෘහයක් තැනීමේ දී එම ස්ථානයෙහි පඤ්චභූතයන්ගේ ක්‍රියාකාරිත්වය කුමන ස්වභාවයක් ගන්නේදැයි මනාව වටහා ගත යුතු ය. එසේ නැතහොත් ගෘහය තැනීමේ දී මෙන් ම තනා අවසන් වී වාසය කරන්නට යොමු වූ විට දී ද විවිධ උපද්‍රවයන්ට ගොදුරු වීමට සිදු වේ. ගෘහයක් තැනීමේ දී සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන් නිවැරදි ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වන්නේ ඒ නිසා ය.

වාස්තුවිද්‍යාව කවදා ආරම්භ වූයේදැයි නිශ්චිත ව නිගමනය කළ නොහැකි ය. ඈත අතීතයෙහි මිනිසුන් කුමන ආකාරයෙන් ජීවත් වූයේ ද යන්න වටහාගත යුත්තේ ඓතිහාසික මෙන් ම පුරාවිද්‍යාත්මක වූ මූලාශ්‍රයන් පාදක කර ගෙන ය. එහෙත් ඈත අතීතයෙහි ගොඩ නගන ලද ගෘහයක කිසිදු නෂ්ටාවශේෂයක් මෙතෙක් හමු වී නොමැත. එහි දී සාහිත්‍යාත්මක වූ මූලාශ්‍රයන් ඔස්සේ තොරතුරු ගවේෂණය කරන්නට සිදු වේ.

පුරාණ ලාංකේය ගෘහනිර්මාණයන්හි ශේෂ ව ඇති නටබුන් ඔස්සේ කරන ලද පර්යේෂණ තුළින් ඒවායෙහි තාක්ෂණික ඥානය සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යා සිද්ධාන්තාශ්‍රිත ව සකස් වූවක් බව තහවුරු වේ. රජමාලිගයේ සිට ගැමි ගෙදර දක්වා අත්තිවාරමේ සිට වහල නිර්මාණය දක්වා ලාංකේය ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා නොමඳ ව සංස්කෘත වාස්තුශාස්ත්‍රඥ ඥානය භාවිත කර ඇත. විජයාවතරණයෙන් ලංකාවට සංක්‍රමණය වූ කර්මාන්තකරුවන් හා මහින්දාගමනය, දුමින්දාගමනය තුළින් පැමිණි ශිල්පශ්‍රේණි පරපුර පාදක කර ගෙන ලංකාවේ වාස්තුවිද්‍යාව මෙන් ම සෙසු ශිල්ප කර්මාන්ත ද බිහි විය. පාරම්පරික තාක්ෂණික ඥානය වශයෙන් අතීතයෙහි සිට වර්තමානය දක්වා ක්‍රමාභිවෘද්ධියට පත් ව ඇත්තේ තත් ශිල්පීය ශ්‍රේණි සතු වූ දැනුම් සම්භාරයයි. භාරතීය ශිල්පීන් යටතේ ශිල්ප පුහුණුව ලද ලාංකේය ශිල්පීහු රට අභ්‍යන්තරය තුළ ගෘහනිර්මාණ කරන්නට යොමු වූහ. එහි දී ඔවුන් දේශීය වූ අවධිමත් ක්‍රමශිල්ප විධිමත් ලෙස ක්‍රමාභිවෘද්ධියට පත් කර ගනු ලැබුවේ භාරතීය ශිල්පීය ඥානය උපයෝගී කර ගෙන ය. භාරතීය වාස්තුවිද්‍යාව ඇතුළු සමස්ත ශිල්පීය ඥානය ම හැදී වැඩී විකසිත ව පැවතියේ සංස්කෘත ශිල්පශාස්ත්‍ර ග්‍රන්ථ මූලාශ්‍රය කර ගෙන ය. ලාංකේය ගෘහනිර්මාණ ශිල්පියා භාරතීය ශිල්පියා තුළින් අවශෝෂණය කර ගත්තේ ද තත් මූලාශ්‍රයාගත සිද්ධාන්තයන් ම ය. මීට අමතර ව ලාංකේය ගෘහනිර්මාණ ශිල්පීන් ස්වකීය අත්පොත ලෙසට භාවිත කරන ලද්දේ පුරාණ මයිමතය නම් හෙළ වාස්තුවිද්‍යා ග්‍රන්ථයයි. මේ ග්‍රන්ථය වර්තමානයෙහි පවා ගෘහනිර්මාණ සැලසුම් ශිල්පීහු ස්වකීය අත්පොත වශයෙන් පරිශීලනය කරති. පුරාණ මයිමතය සපුරා සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්ත සිංහලට පරිවර්තනය කිරීමෙන් සකස් කරන ලද ග්‍රන්ථයක් වේ. ලෝකයෙහි සිදු වූ තාක්ෂණික දියුණුවත් සමග ගෘහනිර්මාණ සැලසුම්කරණය ද ඊට සමගාමී ව දියුණු විය. එහි දී ගෘහනිර්මාණ සඳහා භාවිත මිනිස් ශ්‍රමය යන්ත්‍ර සූත්‍ර හරහා සිදු කර ගැනීම සිදු වූ විශේෂිත ම විපරිණාමය වේ. එසේ ම ගෘහනිර්මාණ සඳහා භාවිත අමුද්‍රව්‍ය ද විශාල වශයෙන්

වෙනස් විය. එහෙත් ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා භාවිත සිද්ධාන්තයන්හි කිසිදු වෙනසක් සිදු නොවුණි. රියන වෙනුවට අඩි, අඟල්, මීටර් ආදි වශයෙන් භාවිත පාරභාෂික සංඥාවන්හි නම් විශාල වෙනසක් සිදු විය. එහෙත් නූතනයෙහි ද ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා භාවිත වන්නේ පුරාණ සමයෙහි භාවිත වූ සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යා සිද්ධාන්තයන් ම වේ. මේ විශ්ලේෂණාත්මක සාධකයන්ට අනුව පුරාණ සමයෙහි සිට නූතනය දක්වා ක්‍රමාභිවෘද්ධියට පත් ව ඇති ලාංකේය ගෘහනිර්මාණ සැලසුම්කරණය සඳහා ඍජු ව ම සංස්කෘත මූලාශ්‍රයාගත වාස්තුවිද්‍යාත්මක සිද්ධාන්තයන් බලපා ඇති බව මනාව පෙනේ.

---

*ප්‍රමුඛ පද : වාස්තු, ගෘහ සැලසුම්, පඤ්චභූත, සිද්ධාන්ත, සංස්කෘත මූලාශ්‍රය*

## THE INFLUENCE OF ARCHITECTURAL TECHNIQUES AS DEPICTED IN SANSKRIT SOURCES FOR HOUSE PLANNING IN SRI LANKA

There is interdependent proximity between man and environment. The great architects who introduced the architectural techniques in Sanskrit have perceived these scientific theorems (techniques). All process in the universe is continued in accordance with Pañcabhūtaḥ such as Pṛthvī, Āp, Tejas, Vāyu and Ākāśa. Not only human body but also the coherence of the entire phenomenon is based on those Pañcabhūtaḥ. It is clear that after penetrating investigation those utmost techniques have been introduced. Directly the human being is influenced by the vibrant of Pañcabhūtaḥ. It will be caused to originate various troubles erecting a house without understanding the condition of the projected place. When you are going to build up a house that is why it is essential that you should have an accurate knowledge about those techniques

Genesis of the Science of Vastu is unable to be deduced. The livelihood and dwelling materials of ancient people are to be broken through based on archeological Sources. No one is able to find out any ancient ruins of a house. That is why we have to go through the literary sources.

It is proved that the technical knowledge of ancient constructions was extracted from Sanskrit Vastu theorems. The theories of Sanskrit vastu have been used for all constructions from the basement to roof of general houses and palaces in Sri Lanka. They were the first constructors of formal dwelling places who had come to Sri Lanka as a result of arrival of king Vijaya as well as Dumindagamanaya. Sri Lankan crafts and architecture or Vastu have originated through those constructors or craftsmen. Our hereditary technical knowledge which has been evaluated up to now is formulated based on their great knowledge. The carpenters who had been trained by Indian architects have taken steps to construct houses in the inward of the country. They have formulated their traditional methods of constructions with the help of Indian scientific theorems. All the dwellings in India have been constructed on theorems depicted in Sanskrit sources which were used as the main principals by Sri Lankans for their constructions. The Purana Mayimataya that was used as a hand book of house building in Sri Lanka was compiled translating Sanskrit stanzas into Sinhala. Simultaneous to the development of technical field of

the world gradually, the System of house planning also changed. Instead of the man power, the usage of mechanism has come into practice as a result of upturn of technology. Theorems of architecture have not changed but the materials that are used for constructions have varied. There is a vital difference of technical terms, instead of cubit, today architects are using Cm, Ft and meter for measurements but there is no any difference of theorems of architecture. The modern architects are using the same theorems as those used by ancient constructors. It is clear that modern and ancient architects in Sri Lanka follow the same theorems that are depicted in sources of Sanskrit Vastu.

***Keywords: Vastu, House Planning, Pañcabhūtaḥ, Theorems, Sanskrit Source***